කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

# පුරප්පාඩු
## පොල් පර්යේෂණ ආයතනය

පොල් පර්යේෂණ ආයතනයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

### 01. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරි තනතුර - පුරප්පාඩු 05

**සුදුසුකම්**

- **බාහිර :**

  පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත්, පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිත සිව් අවුරුදු (4) විශේෂ විද්‍යා හෝ කෘෂිකර්ම උපාධිය

  **හෝ**

  පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත්, දෙවන පෙළ පහළ සාමාර්ථයක් සහිත සිව් අවුරුදු (4) විශේෂ විද්‍යා හෝ කෘෂිකර්ම උපාධිය සමග අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ එක් අවුරුදු (1) පශ්චාත් උපාධිය.

  **හෝ**

  පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් විද්‍යා හෝ කෘෂිකර්ම උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ දෑ අවුරුදු (2) පශ්චාත් පර්යේෂණ උපාධිය.

  **සහ**

  අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (Ph.D) සමග ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ වසර අටක (08) පර්යේෂණ පළපුරුද්ද.

- **අභ්‍යන්තර :**

  ආචාර්ය උපාධිය (Ph.D) සමග AR 1 සේවා කාණ්ඩයේ පර්යේෂණ නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවයක් සපුරා තිබීම.

  **හෝ**

  දෑ අවුරුදු (2) පශ්චාත් පර්යේෂණ උපාධිය (M.Phil/M.Sc.) සමග AR 1 සේවා කාණ්ඩයේ පර්යේෂණ නිලධාරියෙකු වශයෙන් වසර දහයක (10) සතුටුදායක සේවයක් සපුරා තිබීම.

සටහන : මෙම ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ ප්‍රකාශන සකස් කර තිබීම අමතර සුදුසුකමක් සේ සළකනු ලැබේ.

- **වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **සේවා කාණ්ඩය** : ජ්‍යෝෂ්ඨ අධ්‍යයන/ පර්යේෂණ සේවය (AR 2)

- **වැටුප් පරිමාණය** : රු. 76,200-10x2,000-96,200/-

- **ආරම්භක වැටුප් තලය** : රු.76,200.00 [කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 **(I)** අනුව]

- **අනෙකුත් ප්‍රතිලාභ:**

  මූලික වැටුපට අමතරව පහත සඳහන් මාසික දීමනා ද ගෙවනු ලැබේ.

  i. ජීවන වියදම් දීමනාව - රු.17,800/-
  ii. වෘත්තීය දීමනාව
  iii. සන්නිවේදන දීමනාව
  iv. තේ දීමනාව

## 02. ජ්‍යෝෂ්ඨ තාක්ෂණ භුවමාරු නිලධාරි තනතුර - පුරප්පාඩු 02

### සුදුසුකම්

- **බාහිර :**

  පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත්, පළමු පෙළ හෝ දෙවන පෙළ ඉහළ සාමාර්ථයක් සහිත සිව් අවුරුදු (4) විශේෂ විද්‍යා හෝ කෘෂිකර්ම උපාධිය

  **හෝ**

  පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත්, දෙවන පෙළ පහළ සාමාර්ථයක් සහිත සිව් අවුරුදු (4) විශේෂ විද්‍යා හෝ කෘෂිකර්ම උපාධිය සමග අවම වශයෙන් අදාළ ක්ෂේත්‍රයේ එක් අවුරුදු (1) පශ්චාත් උපාධිය.

  **හෝ**

  පිළිගත් විශ්ව විද්‍යාලයකින් අදාළ විෂය සංයෝජනයකින් යුතුව ලබාගත් විද්‍යා හෝ කෘෂිකර්ම උපාධිය සහ අදාළ ක්ෂේත්‍රයේ දෑ අවුරුදු (2) පශ්චාත් පර්යේෂණ උපාධිය.

  **සහ**

  අදාළ ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධිය (Ph.D) සමග ප්‍රථම උපාධිය ලබා ගැනීමෙන් පසු අවම වශයෙන් තාක්ෂණ භුවමාරුව පිළිබඳ වසර අටක (08) පළපුරුද්ද.

- **අභ්‍යන්තර :**

  ආචාර්ය උපාධිය (Ph.D) සමග AR 1 සේවා කාණ්ඩයේ තාක්ෂණ භුවමාරු නිලධාරියෙකු ලෙස අවම වශයෙන් වසර අටක (08) සතුටුදායක සේවයක් සපුරා තිබීම.

  **හෝ**

  දෑ අවුරුදු (2) පශ්චාත් පර්යේෂණ උපාධිය (M.Phil/M.Sc.) සමග AR 1 සේවා කාණ්ඩයේ තාක්ෂණ භුවමාරු නිලධාරියෙකු වශයෙන් වසර දහයක (10) සතුටුදායක සේවයක් සපුරා තිබීම.

**සටහන :** මෙම ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ ප්‍රකාශන සකස් කර තිබීම අමතර සුදුසුකමක් සේ සළකනු ලැබේ.

- **වයස :** අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව බල නොපානු ඇත.

- **සේවා කාණ්ඩය** : ජ්‍යෙෂ්ඨ අධ්‍යයන/ පර්යේෂණ සේවය (AR 2)

- **වැටුප් පරිමාණය** : රු. 76,200-10x2,000-96,200/-

- **ආරම්භක වැටුප් තලය** : රු.76,200.00 [කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 **(I)** අනුව]

- **අනෙකුත් ප්‍රතිලාභ:**

  මූලික වැටුපට අමතරව පහත සඳහන් මාසික දීමනා ද ගෙවනු ලැබේ.

  i. ජීවන වියදම් දීමනාව - රු.17,800/-
  ii. වෘත්තීය දීමනාව
  iii. සන්නිවේදන දීමනාව
  iv. තේ දීමනාව

**<u>පොදු කොන්දේසි</u>**

1. අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.
2. අයදුම්කරු මනා ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වයකින් පසුවිය යුතු ය.
3. අයදුම්කරු දිවයින තුළ ඕනෑම ස්ථානයක සේවය කිරීමට කැමති විය යුතු ය.

**<u>පොදු ප්‍රතිලාභ</u>**

1. 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා පනත යටතේ හා 2016.04.25 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 2/2016 අනුව පාරිතෝෂික ගෙවනු ලැබේ.
2. දායකත්ව වෛද්‍යාධාර යෝජනා ක්‍රමයට හිමිකම් ඇත.
3. අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තියන්ගේ භාර අරමුදල (අපේක්ෂකයන් විසින් වැටුපෙන් 10% ක් හා මණ්ඩලය විසින් 15% ක් අර්ථසාධක අරමුදල සඳහා සහ 3% ක් සේවා නියුක්තියන්ගේ භාර අරමුදල සඳහා ද දායක වනු ඇත.)
4. පොල් පර්යේෂණ ආයතනයේ සේවකයින් හට ලැබෙන අනෙකුත් ප්‍රතිලාභ ද හිමිවනු ඇත

අයදුම්කරුවන් විසින් <u>උප්පැන්න සහතිකය සහ අනෙකුත් අදාළ සියලුම අධ්‍යාපන හා වෙනත් සහතිකපත්වල පිටපත් සහ චරිත සහතික දෙකක් (ඉන් එකක් ග්‍රාම නිලධාරිගෙන් විය යුතුය), ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම්, ලිපිනයන් සහ දුරකථන අංක ද සමග අයදුම්කරු විසින් **අත්සන් කරන ලද**</u> තම අයදුම්පත **<u>2024.07.09</u>** වන දින හෝ ඊට පෙර ලැබෙන සේ **සභාපති, පොල් පර්යේෂණ මණ්ඩලය, ලුණුවිල 61150** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ප්‍රමාද වී එවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

රජයේ දෙපාර්තමේන්තු/ සංස්ථා/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල සේවය කරන නිලධාරීන් තම අයදුම්පත් ඔවුන්ගේ ආයතන ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතු ය. අයදුම්පතේ පිටපතක් සෘජුවම එවිය හැකි ය.

ලිපි කවරයේ වම්පස ඉහල කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය.

අදාල සහතිකවල පිටපත් නොමැතිව එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන බව කාරුණිකව සලකන්න.

**මේ පිළිබඳව බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

මෙම දැන්වීම පොල් පර්යේෂණ ආයතනයේ නිල වෙබ් අඩවිය වන www.cri.gov.lk හි ද පළකර ඇත.

සභාපති
පොල් පර්යේෂණ මණ්ඩලය
ලුණුවිල

2024.06.19